# මැතිවරණ කොමිෂන් සභාව
## தேர்தல்கள் ஆணைக்குழு

**පොදු කාර්යාලය:** 011-2868441, 2868442, 2868443
பொது அலுவலகம்
ෆැක්ස්/தொலைநகல்: 011-2868426

**මැතිවරණ කොමිෂන් සභා කාර්යාලය**
සරණ මාවත,රාජගිරිය (10107)
தேர்தல்கள் ஆணைக்குழு அலுவலகம
சரண மாவத்தை, இராஜகிரிய (10107)

*web : www.elections.gov.lk* *e-mail : info@elections.gov.lk*


මගේ අංකය : TR/PE/01/2020 ඔබේ අංකය : දිනය : 2020.06.24
எனது இல. உமது இல. திகதி

චක්‍රලේඛ අංක **-PE/2020/TR - 07**

**සියළුම තේරීම්භාර නිලධාරීන් සහ**
**නියෝජ්‍ය / සහකාර මැතිවරණ කොමසාරිස්වරුන් වෙත,**

**<u>පාර්ලිමේන්තු මැතිවරණය - 2020.08.05</u>**
**<u>ඡන්ද පොළ ප්‍රවාහන කටයුතු සඳහා පෞද්ගලික බස්රථ යොදා ගැනීම.</u>**

2020.08.05 දින පැවැත්වීමට නියමිත පාර්ලිමේන්තු මැතිවරණයේ දී ඡන්ද පොළ කාර්ය මණ්ඩලය, ලිපිද්‍රව්‍ය, ඡන්ද පෙට්ටි හා අනෙකුත් ද්‍රව්‍ය ප්‍රවාහනය කිරීම සඳහා ඔබට අවශ්‍ය බස්රථ ලබා ගැනීමේදී ශ්‍රී ලංකා ගමනා ගමන මණ්ඩලයේ බස්රථ වලට අමතරව පෞද්ගලික බස්රථද ලබාගැනීමට කටයුතු කළ හැකිය. ඔබගේ දිස්ත්‍රික්කයේ ඡන්ද පොළ ප්‍රවාහන කටයුතු සඳහා පෞද්ගලික බස්රථ ද යොදා ගැනීමට බලාපොරොත්තු වන්නේ නම් ඔබට අවශ්‍ය බස්රථ සංඛ්‍යාව ගණනය කර **<u>මීට අමුණා ඇති ලිපියේ සඳහන් දිස්ත්‍රික් නියෝජිතයා අමතා අවශ්‍ය බස්රථ ප්‍රමාණය ලබාගැනීමට කටයුතු කරන්න.</u>**

02. මෙම බස්රථ ලබාදීමට එකඟවූ ගාස්තු ප්‍රමාණයන් පහත දැක්වෙන අතර, එම ගාස්තු ප්‍රමාණයන් යටතේ ඡන්ද විමසීම නිමවීමෙන් පසු ඔබ ලබාගත් බස්රථ සඳහා ගෙවීම් කිරීමට කරුණාකර කටයුතු කරන්න.

**දිස්ත්‍රික්කය තුළ ධාවනයේදී දිනකට ගෙවීම.**

| | ආසන 42 හෝ ඊට වැඩි (රුපියල්) | ආසන 30 සිට 40 දක්වා (රුපියල්) | ආසන 25 සිට 29 දක්වා (රුපියල්) |
|---|---|---|---|
| කි.මී. 50 දක්වා | 8850/- | 8350/- | 7850/- |
| කි.මී.51 සිට 75 දක්වා | 10850/- | 10350/- | 9850/- |
| කි.මී.76 සිට 100 දක්වා | 12850/- | 12350/- | 11850/- |
| කි.මී. 101 සිට 125 දක්වා | 14350/- | 13850/- | 13350/- |
| කි.මී. 125 ට වැඩිවන විට කි.මී. 1 කට | රු. 80/- | | |

02 පිටුවට

03. ඉහත ගෙවීම් වලට අමතරව ආහාර වෙනුවෙන් රියදුරුට දිනකට රු.900/- ක මුදලක් ගෙවිය යුතුය. රිය සහායකවරයෙකු සිටී නම් ඔහු වෙනුවෙන්ද දිනකට රු.900/- ක මුදලක් ගෙවිය හැකිය. මෙම බස්රථ ඡන්ද විමසීමේ දිනයට පෙරදින (එනම් 2020.08.04 දින) උදෑසන නිකුත් කිරීමේ මධ්‍යස්ථාන වෙත කැඳවීම ප්‍රමාණවත් වන අතර, ඒ අනුව දින දෙකකට මෙම ගෙවීම කළ හැකිය. <u>ඇතැම් බස්රථ සඳහා රිය සහායක නොමැති වුවහොත් එම බස්රථ සඳහා ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපති විසින් රැගෙන යන කාර්යාල කාර්ය සහායක මහතෙකුගේ හෝ පොලිස් නිලධාරී මහතෙකුගේ සහාය ලබාදීමට කටයුතු කරන ලෙසට ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපතීන්ව දැනුවත් කළ යුතුය.</u>

04. තවද ඡන්ද පෙට්ටි නිකුත් කරන දින පෞද්ගලික බස්රථ අදාළ කාර්යයන් සඳහා යෙදවීමේදී මෙම බස්රථ එක් එක් ඡන්ද මධ්‍යස්ථාන වෙත පිටත් කර හැරීමට ප්‍රථම ඔවුනට අදාළ ඡන්ද මධ්‍යස්ථානයට යා යුතු ගමන් මාර්ගය පිළිබඳව මාර්ග සටහනක් බස්රථයේ රියදුරු මහතා වෙත ලබාදීමට කරුණාකර කටයුතු කරන්න.

05. මෙම වැඩපිළිවෙල සංවිධානය කර ගැනීමේදී මේ සමග අමුණා ඇති ලැයිස්තුවේ සඳහන් ඔබ දිස්ත්‍රික්කයට අදාළ නියෝජිතයා අමතා ඔහුගේ සහාය ඔබට ලබා ගත හැකිය. ඔහුගේ ජංගම දුරකථන අංකයෙන් ඔහු සම්බන්ධ කර ගැනීමට අපහසුතාවයක් ඇති වුවහොත් සංගමයේ සභාපති ගැමුණු විජේරත්න මහතාගේ ජංගම දුරකථන අංකය වන 077-7783255 අංකයට අමතන්න.

මැතිවරණ කොමිෂන් සභාවේ නියමය පරිදි,

**සමන් ශ්‍රී රත්නායක,**
මැතිවරණ කොමසාරිස් ජනරාල්.

**පිටපත්** :- 1.ලේකම්, මැතිවරණ කොමිෂන් සභාව.
2. විගණකාධිපති
3. අතිරේක මැතිවරණ කොමසාරිස් (ජාතික මැතිවරණ)
4. ප්‍රධාන මූල්‍ය නිලධාරී
5. ප්‍රධාන අභ්‍යන්තර විගණක
6. ගණකාධිකාරී (ගෙවීම්)
7. ගැමුණු විජේරත්න මහතා,
සභාපති,
ලංකා පෞද්ගලික බස් හිමියන්ගේ සංගමය.
} කල්වේලා ඇතිව ඔබගේ දිස්ත්‍රික් සම්බන්ධීකරණ නියෝජිතයන් දැනුවත් කිරීමට කරුණාකර පියවර ගන්න.

**සභාපති**
தவிசாளர்
දුරකථන/தொலைபேசி : 011-2868444
ෆැක්ස්/ தொலைநகல்: 011-2868445
*e-mail :chairman@elections.gov.lk*

**සහකාර මැතිවරණ කොමසාරිස් (පාලන)**
உதவித் தேர்தல்கள் ஆணையாளர் (நிருவாகம்)
දුරකථන/தொலைபேசி:011-2868450
ෆැක්ස්/தொலைநகல் : 011-2868450
*e-mail : admin@elections.gov.lk*

**පරිපාලන නිලධාරී**
நிருவாகஅலுவலர்
දුරකථන/தொலைபேசி: 011-3083371
ෆැක්ස්/தொலைநகல் :011-3083371
*e-mail : info@elections.gov.lk*

**ලංකා පෞද්ගලික බස් හිමියන්ගේ සංගමය.**
නො.06,
නාවල පාර,
නුගේගොඩ.

දුරකථන අංක : 011-2822459
ෆැක්ස් අංක : 011-2825947

**<u>ලංකා පෞද්ගලික බස්හිමියන්ගේ සංගමයේ දිස්ත්‍රික් බස් නියෝජිතයින්,</u>**

ලංකා පෞද්ගලික බස් නියෝජිතයින් පහතින් දැක්වේ. ඔවුන්ව සම්බන්ධීකරණය කරගන්න. යම් ගැටළුවක් වුවහොත් සංගමයේ ප්‍රධාන කාර්යාලයට, පහත දුරකථන අංකයට දැනුම් දෙන්න. (**0777783255 - ගැමුණු විජේරත්න මහතා**)

| **අනු අංකය** | **දිස්ත්‍රික්කය** | **නම** | **දු.ක.අංකය** |
|---|---|---|---|
| 1 | කොළඹ | ගැමුණු විජේරත්න මහතා | 0777783255 |
| 2 | ගම්පහ | ඩී.මිල්ටන් පෙරේරා මහතා | 0777613774 |
| 3 | කළුතර | නිමල් ජයලත් මහතා | 0716846195 |
| 4 | කෑගල්ල | රුවන් චමිල මහතා | 0716372447 |
| 5 | රත්නපුරය | ජේ.එම්.ජයවීර මහතා | 0757274812 |
| 6 | මාතර | ඒ.රණවක මහතා | 0718116522 |
| 7 | ගාල්ල | ඩී.ලංකේෂ්වර මහතා | 0723837457 |
| 8 | හම්බන්තොට | ඩී.එස්.එස්.ගුණවර්ධන මහතා | 0779003792 |
| 9 | අනුරාධපුරය | ඩී.අජන්ත මහතා | 0716558658 |
| 10 | පොලොන්නරුව | රොෂාන් ගාල්ලගේ මහතා | 0778754108 |
| 11 | මහනුවර | සරත් මහානාම මහතා | 0757371064 |
| 12 | මාතලේ | ධනුස්ක වික්‍රමසිංහ මහතා | 0773698752 |
| 13 | නුවරඑළිය | බී.සේනාරත්න මහතා | 0778131903 |
| 14 | බදුල්ල | අනුර රාජපක්ෂ මහතා | 0772877888 |
| 15 | මොණරාගල | එච්.පී.සාගර මහතා | 0774962517 |
| 16 | ත්‍රිකුණාමලය | ජී.ජී.විමලසේන මහතා | 0662270028 |
| 17 | අම්පාර | එච්.ඩී.ගුණදාස මහතා | 0773037414 |
| 18 | මඩකලපුව | එස්.ඩී.එම්.එස්.ඒ.මවුලානා මහතා | 0773672159 |
| 19 | පුත්තලම | එම්.එස්.මොහමඩ් රාමු මහතා | 0767114579 |
| 20 | කුරුණෑගල | එම්.ඩී.ජේ.සේනාධීර මහතා | 0777179631 |
| 21 | යාපනය | පී.කෙන්ගාදරම් මහතා | 0778150050 |
| 22 | මන්නාරම | කේ.මුරුගේස් මහතා | 0776036651 |
| 23 | වවුනියාව | එස්.ටී.කේ.රාජේස්වරන් මහතා | 0772417033 |
| 24 | කිළිනොච්චිය | එන්.නගුලේශ්වරන් මහතා | 0775584384 |
| 25 | මුලතිව් | ඒ.සිවලෝගේස්වරන් මහතා | 0771133424 |

*** ඒ.ඩී.එම්.එස්.මවුලානා මහතා අම්පාර දිස්ත්‍රික්කය සහ කල්මුනේ ප්‍රදේශයන්ද ආවරණය කරනු ඇත.**